# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 37 දරන
# පානදුර වැලිපිටියේ
# අභය කරුණාරත්න මුදලින්ද්‍රාරාමස්ථ
# ශ්‍රී චන්ද්‍රමුනි
# ධර්මායතන සංවර්ධන සභාව
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 10 දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1992 අගෝස්තු මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

**1992 අංක 37 දරන පානදුර වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමස්ථ ශ්‍රී චන්දමුනි ධර්මායතන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත.**

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 10 දින]

එල්. ඩී.—ඕ. 12/90

**පානදුර වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමස්ථ ශ්‍රී චන්දමුනි ධර්මායතන සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"පානදුර වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමස්ථ ශ්‍රී චන්දමුනි ධර්මායතන සංවර්ධන සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පානදුරේ වැලිපිටියේ පිහිටුවා තිබුණු හෙයින් ද: **පූර්විකාව.**

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම්කර ඇති හෙයින්ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 37 දරන පානදුර වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමස්ථ ශ්‍රී චන්දමුනි ධර්මායතන සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන පානදුර වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමස්ථ ශ්‍රී චන්දමුනි ධර්මායතන සංවර්ධන සභාවේ දැනට සාමාජිකයන්ව සිටින හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තාක් තැනැත්තන් සංඛ්‍යාව, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පානදුර වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමස්ථ ශ්‍රී චන්දමුනි ධර්මායතන සංවර්ධන සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන අතර, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. **පානදුර වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමස්ථ ශ්‍රී චන්දමුනි ධර්මායතන සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— **සංස්ථාවේ පොදු පරමාර්ථ.**

(අ) අභය කරුණාරත්න මුදලින්දාරාමයේ ගොඩනැගිලි නඩත්තු කිරීම සහ ඊට අවශ්‍ය නව ගොඩනැගිලි ඉදි කිරීම සහ ඒවා නඩත්තු කිරීම;

(ආ) ශ්‍රී චන්දමුනි ධර්මායතනය මුල් කරගෙන අධ්‍යාපනික පන්ති, දේශන, සම්මන්ත්‍රණ සහ විභාග පැවැත්වීම හා සහතික පත්‍ර හා ත්‍යාග ප්‍රදානය කිරීම;

(ඇ) බුද්ධ ධර්මය සහ සිංහල, පාලි, සංස්කෘත භාෂාවල උන්නතිය සඳහා කටයුතු කිරීම;

(ඈ) මෙරටෙහි සහ විදේශයන්හි ධර්මදූත සේවා ඇති කිරීම සහ ධර්ම ප්‍රචාරක කටයුතු කිරීම;

(ඉ) සාමණේර අභ්‍යාස විද්‍යාලයක් පිහිටුවීම සහ බෞද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම;

(ඊ) ශ්‍රී චන්දමුනි දහම් පාසල පවත්වාගෙන යාම සහ එය වැඩි දියුණු කිරීම;

(උ) අභය කරුණාරත්න මුදලින්දාරාමයේ නේවාසික භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනය සහ සිවුපසය සැලැස්වීම;

(ඌ) ආදි කර්තෘ ගුණානුස්මරණ වාර්ෂික පුණ්‍යෝත්සවය සහ සංස්ථාව විසින් අනුමත කරනු ලබන අනෙකුත් සියලු ආගමික උත්සව පැවැත්වීම;

(එ) ඉහත සඳහන් පරමාර්ථ ඉෂ්ට කරගැනීම සඳහා අරමුදලක් පිහිටුවීම සහ එය පාලනය කිරීම;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ සියල්ල හෝ ඉන් යමක් ඉෂ්ට කර ගැනීම සඳහා හිතකර හෝ ආනුෂංගික සියලු ක්‍රියා හා දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වසා දැමීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ඉෂ්ට කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය, සංස්ථාවට ඇත්තේ ය.

විධායක කමිටුව.

5. (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත විධායක කමිටුවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සභාවේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, නිලධරයන් සහ විධායක කමිටුව තෝරා පත් කර ගැනීම සඳහා ද, සංස්ථාවේ විධායක කමිටුවේ, විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සඳහා ද, සංස්ථාවේ කටයුතු කරගෙන යාමේදී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කට යුතු පරිපාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් මේ පනතේ විධි විධානවලට අනනුකූල නොවන රීති සෑදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ කිසිම රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මිස වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලපැවැත්වූ සභාවේ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ පනත යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සභාව විසින් ගෙවිය යුතු සහ සභාවට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති සභාවේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සභාවට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරය

කිරීමේ බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.**

9. විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.